# වැලිගම ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී මිලට ගත් හා පරිත්‍යාග ලෙස ලැබූ රු.4,694,691 ක් වටිනා ඉඩම්, ගොඩනැගිලි සහ අනෙකුත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන වෙනුවෙන් 2014 ජුලි 07 දින ලබාදී ඇති රු.1,000,000 ක මුදල ප්‍රාග්ධන ආධාර ලෙසට ගිණුම්ගත නොකර වෙනත් ආධාර අය ශීර්ෂයට බැර කර තිබුණි.

(ඇ) කඹුරුගමුව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ ආයුර්වේද ගොඩනැගිල්ල නවීකරණය සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු.550,000 ක් වටිනා ණයහිමියන් ප්‍රතිපාදනය කළයුතු වුවද රු.5,050,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබීමෙන් වැඩිපුර ප්‍රතිපාදනය කර තිබූ මුදල රු.4,500,000 ක් විය.

(ඈ) සේවක ණය ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට වැඩිපුර අයවී තිබූ රු.4,500 ක මුදල සේවක ණය ගිණුමේ බැර ශේෂයක් ලෙස නොදක්වා සේවක ණය ශේෂයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඉ) සභාව නියෝජනය කිරිමට නොපැමිණි මන්ත්‍රීවරු සඳහා ගෙවන ලද රු.22,400 ක සභික දීමනාව 2014 මාර්තු මාසයේදි අයකරගෙන වැටුප් හා දීමනා වැය ශීර්ෂයට බැර නොකර වෙනත් ආධාර 1.70 අයශීර්ෂයට බැර කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල සභිකයින්ගේ ඉන්ධන වියදම් වූ රු.759,000 ක මුදල ගමන් වියදම් වැය ශීර්ෂයට හර නොකර සැපයුම් හා උපකරණ වැය ශීර්ෂයට හර කර තිබුණි.

(උ) වරිපනම් බදු ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු සඳහා වැඩිපුර ලැබීම් රු.34,405 ක මුදල වරිපනම් බදු පාලන ගිණුමේ බැර ශේෂයක් ලෙස නොදක්වා හිඟ ශේෂයෙන් අඩුකර දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් බදු හා අක්කර බදු සඳහා අයකළ අධිගාස්තු රු.18,684 ක මුදල වර්ෂයේ ආදායමට බැර නොකර ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක වෙනත් ආදායම් ණයගැති වටිනාකම රු.28,924,258 ක් වුවද ප්‍රධාන ලෙජරය අනුව ගිණුම්ගත වී තිබුණේ රු.20,754,151 ක් පමණක් වූයෙන් අඩුවෙන් ගිණුම් ගතවී තිබූ මුදල රු.8,170,107 ක් විය. ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ මෙම මුදල සමුච්චිත අරමුදල බැර නොකොට වර්ෂය අවසානයට වෙනත් ආදායම් ණයගැති වටිනාකම වූ රු.45,235,870 ක මුදලින් අඩුකර දක්වා තිබුණෙන් මූල්‍ය ප්‍රකාශන වල ණය ගැති වටිනාකම රු.37,065,763 ක් වී තිබුණි.

(ඒ) සභා බල ප්‍රදේශයෙහි සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල කැබලි කර විකුණන ලද වෙන්දේසි ඉඩම් වලින් පොදු කටයුතු සඳහා සභාවට වෙන්කරන ලද ඉඩම් කොටස් 24 හි වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කර ඇති ගිණුම් විෂයයන් 11 කට අදාල ශේෂයන්ගේ වටිනාකම රු.79,282,899 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.81,021,414 ක් වූයෙන් රු.1,738,515 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.3,438,467 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.5,545,105 ක් විය.

(ඇ) නිරවුල් නොකළ ගිණුම්

ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.3,506,889 ක් වූ ගිණුම් ශේෂ 06 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.170,403,841 ක් වටිනා වත්කම් හා රු.16,734,826 ක් වටිනා බැරකම් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා, යාවත්කාලීන හා විධිමත් ස්ථාවර වත්කම් ලේඛන, ආයෝජන ලේඛන, ශේෂ සනාථ කිරීම් හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 නීති, රීති , හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය | 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් උත්සව වියදම් සඳහා පිළිවෙලින් රු.725,900 ක් හා රු.260,500 ක් වශයෙන් රු.986,400 ක මුදල් සහා අරමුදලින් වැයකර තිබුණද ඒ සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ පූර්ව අනුඥාව ලබා ගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,945,594 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,051,773 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 9,057 | 2,715 | 1,044 |
| කුලී | 3,369 | 3,294 | 1,375 |
| බලපත්‍ර ගාස්තු | 4,229 | 7,423 | 543 |
| වෙනත් ආදායම් | 82,020 | 80,009 | 64,897 |

2.2.2 වරිපනම් බදු

2014 වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම් අධිගාස්තු සමඟ රු.287,546 ක් වූ අතර එකී මුදලින් වර්ෂය තුල ලැබීම් රු.67,521 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් බදු අයවීමේ ප්‍රගතිය සියයට 23 ක් විය. 2014 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.989,990 ක් වූ අතර 2014 වර්ෂයේදී එකී හිඟ අයවීම් රු.261,943 කි. ඒ අනුව හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 26 ක් විය.

2.2.3 අක්කර බදු

සමාලෝචිත වර්ෂයට අදාල අක්කර බදු, බිල් කිරීම් අධිගාස්තු සමග රු.11,029 ක් වූ අතර එම මුදලින් වර්ෂය තුල ලැබීම් රු.584 ක් පමණක් වූයෙන් සමාලෝචිත වර්ෂයට අදාල අක්කර බදු අයවීමේ ප්‍රගතිය සියයට 5 ක් විය. 2014 ජනවාරි 01 දින හිඟ ශේෂය රු.100,943 ක් වූ අතර එකී හිඟ ශේෂයෙන් වර්ෂය තුල අයවූ මුදල රු. 74 ක් පමණක් වූයෙන් හිඟ මුදල් අයවීමේ ප්‍රගතිය සියයට 0.02 ක් විය.

2.2.4 කසල බදු

(i) වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංචාරක නිකේතන වලින් එකතුවන කසල ඉවත් කිරීම සඳහා එක් සංචාරක නිකේතනයකින් රු.1,000 ක අවම බද්දක් අය කිරීමට 2014 දෙසැම්බර් 26 වන දින සභා රැස්වීමේදී තීරණය කර තිබුණද 2013 ජනවාරි මාසයේ සිට මෙම බද්ද අය කිරීම ආරම්භ කර තිබුනි. මෙම බද්ද අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි.

(ii) තවද සභා බල ප්‍රදේශයේ සංචාරක නිකේතනවලින් මසකට රු.1,000 ඉක්මවා බදු මුදල් අයකර තිබුණද එසේ බදු මුදල් තීරණය කරන ලද ආකාරය අනාවරණය නොවූ අතර 2014 දෙසැම්බර් මස 31 දින වන විට 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් සංචාරක නිකේතන 18 කින්, රු.1,047,000 ක් අයවීමට තිබුණද එම මුදල අයකර ගැනීමට 2015 අප්‍රේල් මස අවසාන වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 41,951,405 |
| මුද්දර ගාස්තු | 2,700,000 |

2.2.6 වැලිගම, මිදිගම තුර්කි ගම්මානයේ කඩ කාමර බදු

මිදිගම තුර්කි ගම්මාන නිවාස ව්‍යාපාතියේ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 21 ක් , 2006 නොවැම්බර් 27 දිනැති පැවරුම් ලිපියක් මගින් වැලිගම ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රාදේශීය සභාව වෙත පවරා දී තිබුණි.

(i) 2006 නොවැම්බර් 28 දින මෙම කඩ කාමර 21 බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබූ අතර ලද ටෙන්ඩර් පත් අනුව කඩ කාමර 10 ක් බදුකරුවන් වෙත ලබාදී ඒකපාර්ශවීය ගිවිසුම් අත්සන් කර තිබූ අතර කඩ කාමර අංක 09 හා 10 දරන කඩ බදුකරුවන් විසින් එකවර ගෙවිය යුතු බදු මුදලින් රු.100,000 බැගින් හිඟව තිබූ නමුත් එම මුදල අයකර ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි.

(ii) මෙම කඩ කාමර ලිඛිතව පවරා ගෙන බදු දිය යුතු බවට මාතර සහකාර පළාත් පාලන කොමසාරිස්, විසින් 2015 මැයි 07 දිනැති ලිපිය මගින් සභාව වෙත දැනුම් දී තිබුණද ඒ වන විටත් මෙම කඩ කාමර බදු දිය හැකි බව ප්‍රාදේශීය ලේකම් වරයා විසින් 2006 නොවැම්බර් 26 දිනැති පැවරුම් ලිපිය මගින් සභාවට දැනුම් දී තිබුණි.

(iii) 2007 වසරේ සිට කඩ කාමර දහයකින් නිසි පරිදි බිල්කර බදු මුදල් අය නොකිරීම නිසා සභා අරමුදලට වූ පාඩුව රු.1,098,000 ක් වන අතර ඉතිරි කඩ කාමර 11 බදුදීමට කටයුතු නොකිරීම නිසා සභා අරමුදලට සිදුවූ පාඩුව රු.1,207,800 ක් ද වශයෙන් 2014 දෙසැම්බර් 31 දිනට සිදුවූ මූල්‍ය පාඩුවේ එකතුව රු.2,305,800 ක් විය.

(iv) මෙම කඩ කාමර සඳහා විදුලිය ලබා ගැනීමේදී ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී තිබුනේ සභාව වන අතර බදු දෙන අවස්ථාවේදී අදාල බදුකරු සමඟ අත්සන් කරන ලද ගිවිසුම ප්‍රකාරව විදුලි බිල්පත් ඔවුන් විසින් නිරවුල් කළයුතු වන බවට වගන්තියක් ඇතුළත් කර නොතිබුණි. මේ නිසා 2013 ඔක්තෝබර් 29 දිනැති සභා තීරණය පරිදි විදුලි බිල්පත් සඳහා රු.63,012 ක මුදලක් සභා අරමුදලින් ගෙවීමට සිදුව තිබුණි.

(v) තවද සභාව විසින් ලංකා විදුලි බල මණ්ඩලය සමඟ විදුලි සැපයුම් සඳහා ගිවිසුම්ගතවී ඇති බැවින් දැනට එන්තර වාසි එවා ඇති රු.1,249,475.77 ක මුදලද සභාවට ගෙවීමට සිදුවිය හැකි බවද නිරීක්ෂණය විය.

## 2.3 අධිභාර

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිභාර සහතික 06 ක් සහ නිවේදන 02 ක් සභාවේ සභාපතිවරයාට හා නිලධාරීන් වෙත යොමුකර තිබූ අතර එකී අධිභාර සම්බන්ධයෙන් ගතයුතු පියවර ගැනීමට පළාත් පාලන කොමසාරිස්වරයාගේ අවධානය යොමුකරවා නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධන ඇගයීම

### 3.1.1 මංමාවත් පරිපාලනය

සමාලෝචිත වර්ෂය සඳහා සම්මත කරගෙන ඇති අයවැය ලේඛනය අනුව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය වර්ග කි.මී. 101.04 ක් විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය අනුව සභා බල ප්‍රදේශයෙහි සභාවට අයත් මාර්ග 153 ක් 2013 අගෝස්තු 16 දිනැති අංක 1824 දරන ගැසට් පත්‍රය මගින් ලියාපදිංචි කර තිබුණද, ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ නොකරන ලද මාර්ග සභා බල ප්‍රදේශයේ පවතින බව සභාව විසින් සංවර්ධනය කර ඇති මාර්ග සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

(ආ) සභාවට අයත් මංමාවත්වල එක් එක් මාර්ගයේ දිග, පළල, ආරම්භක ස්ථානය හා අවසන් වන ස්ථානය, තාර, කොන්ක්‍රීට්, බොරළු ලෙසට මාර්ගයේ ස්වභාවයද, වීථි රේඛාද යන තොරතුරු ඇතුළත් කර මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වාගත යුතු වුවත් එසේ ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි යටතේ උපකරණ වැය, ඉඩම්, ඉඩම් වැඩිදියුණු කිරීම් හා ගොඩනැගිලි වැය සඳහා රු.19,400,000 ක ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කර තිබුණි. එහි මාර්ග සංවර්ධනයට මුදල් වෙන්කර නැති අතර, 2014 වර්ෂයේදී සංවර්ධනය කිරීමට අදාල මාර්ග ලැයිස්තුවක්ද අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. එසේ වුවද වැඩ සටහන් අංක 03 හි මාර්ග, හා බෝක්කු ඉදිකිරීම හා සංවර්ධනය සඳහා රු.37,105,700 ක මුදලක් වැයකර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

3.2.1 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | අතිරික්ත |
|---|---|---|---|
| විධායක | 01 | 01 | - |
| තෘතියික | 01 | 01 | - |
| ද්විතියික | 26 | 29 | 03 |
| ප්‍රාථමික | 43 | 77 | 34 |
| වෙනත් (අනියම්,තාවකාලික) | - | 06 | 06 |
| | 71 | 114 | 43 |

පහත නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබේ.

(i) දකුණු පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සඳහා සමාලෝචිත වර්ෂයේදි රු.15,214,400 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර 2014 වර්ෂයට කාර්ය මණ්ඩල වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම සඳහා රු.31,316,695 ක මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.16,102,295 ක අතිරේක වැය බරක් වී තිබුණි.

(ii) භාණ්ඩාගාර ලේකම්ගේ හා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටවිය යුතු බව දක්වා තිබුණද වැලිගම ප්‍රාදේශීය සභාව 2014 වර්ෂයේදී සේවකයින් 06 දෙනෙකු බඳවා ගෙන සභා අරමුදලින් වැටුප් ගෙවා තිබුණි.

(iii) ප්‍රාදේශීය සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල ස්වයං උත්පාදන ආදායම රු.62,050,158 ක් වූ අතර, එකී ආදායමින් රු.46,319,104 ක් හිඟ ආදායම් විය. ඒ අනුව තථ්‍ය වශයෙන් වර්ෂය තුල අයකරගෙන ඇති ආදායම රු.15,731,054 කි. වර්ෂයේ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සඳහා සභා අරමුදලින් අතිරේකව ගෙවන ලද මුදල රු.16,102,295 ක් වන අතර එකී මුදල වර්ෂයේ අයකරගත් ස්වයං උත්පාදන ආදායමද ඉක්මවා තිබුණි.

(iv) සභාවේ අනෙකුත් ප්‍රවර්තන වියදම් වලට සාපේක්ෂව කාර්යය මණ්ඩල පිරිවැය සඳහා ස්වයං උත්පාදන ආදායමින් සියයට 50.47 ක් වෙන් කිරීමට සිදුව තිබීම නිසා ඉදිරියේදී මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපෑ හැකි හෙයින් ආදායම් ප්‍රවර්ධනය කර ගැනීම හා වැටුප් ප්‍රතිපූර්ණය සම්පූර්ණයෙන්ම ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

4.1 සභා රැස්වීම් වාර්තා
-----------------------

1988 ප්‍රාදේශීය සභා (රැස්වීම් වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පරිපාටිය) රීති පරිදි සභා රැස්වීම් පැවැත්වීම සිදුව නොතිබුණි. විස්තර මෙසේය.

(i) 2014 පෙබරවාරි මාසය සඳහා පෙබරවාරි 26 හා මාර්තු 05 දිනවල පවත්වන ලද මහා සභා රැස්වීම් සන පූර්ණයක් නොමැතිව රැස්වී නොතිබූ අතර ඒ හේතුවෙන් පෙබරවාරි මාසය සඳහා සභාව රැස්වීමක් පවත්වා නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ විශේෂ මහා සභා රැස්වීමක් සමග සභා වාර 13 ක් පවත්වා ඇති අතර ඉන් 13 ටම සහභාගී වී තිබුනේ සභිකයින් දෙදෙනෙකු පමණි. එක් සභිකයෙකු සභා වාර 10කටද සභිකයන් දෙදෙනෙකු සභා වාර 7 කටද සහභාගී වී නොතිබුණි. තවද සභිකයින් 05 දෙනෙකු සභා රැස්වීම් වලට සහභාගී වුවද කිසිදු සාකච්ඡාවකට සහභාගී වී නොතිබූ අවස්ථාද විය.

(iii) 1988 සභා රැස්වීම් රීති (ඉ)(ඊ) යටතේ දැක්විය යුතු මුදල් යෝජනා එකී ස්ථානවල නොදක්වා සභාපතිවරයා කරනු ලබන විශේෂ නිවේදන යටතේ දක්වා සම්මත කරගෙන තිබූ අතර පනතේ 132 (ඒ) වගන්තියට පටහැනිව සභා අරමුදලින් ගෙවිය නොහැකි වියදම් සඳහාද සභා යෝජනා සම්මත කරගෙන තිබුණි.

4.2 අයවැය පාලනය
------------------

(අ) ප්‍රාදේශීය සභාව 2014 වර්ෂයට සම්මත කරගෙන ඇති අයවැය ලේඛනය අනුව නිවාස ව්‍යාපෘතියකට හා සනීපාරක්ෂක ව්‍යාපෘතියක් සඳහා නිවාස හා වැසිකිළි ඉදිකිරීමට ප්‍රතිලාභීන්ට ගෙවීමට මුදල් ඇස්තමේන්තු කරගෙන නොතිබුණ අතර ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනයක්ද දක්වා නොතිබුණි.එසේ වුවද සමාලෝචිත වර්ෂයට ඉදිරිපත් කරන ලද මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශය අනුව සෞඛ්‍ය සේවා වැඩ සටහනෙහි උපකරණ වැය, ඉඩම්, ඉඩම් වැඩි දියුණු කිරීම් හා ගොඩනැගිලි වැය ශීර්ෂයට හර කර ඇති රු.7,509,547 ක මුදල තුල සනීපාරක්ෂක ව්‍යාපෘතියට අදාලව රු.1,890,000 ක මුදලක්ද, 2014 නිවාස ව්‍යාපෘතිය සඳහා රු.5,650,000 ක මුදලක්ද ලෙස රු.7,540,000 ක මුදලක් හර කර තිබුණි. ඒ අනුව අයවැය ලේඛනයේ එකී ව්‍යාපෘති සඳහා නිසි පරිදි මුදල් සම්මත කර නොගෙන 2014 දෙසැම්බර් 31 දිනට උපචිත ගෙවීම් ලෙස දක්වා 209 වැය ශීර්ෂයට ඉහත මුදල හර කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2014 අයවැය ලේඛනයේ සඳහන් ප්‍රාග්ධන අයවැය යෝජනා යටතේ සෞඛ්‍ය සේවා යෝජනා 05 ක්ද, භෞතික සැලසුම් යෝජනා 04 ක්ද, වෙනත් උපයෝගී සේවා යෝජනා 03 ක්ද සුභ සාධන සේවා යෝජනා 15 ක්ද, ප්‍රජා සංවර්ධන සේවා යෝජනා 04 ක්ද, ඉලක්කගත කර තිබුණද එකී යෝජනා සඳහා වැය කිරිමට අපේක්ෂිත වියදම් ඇස්තමේන්තුකර දක්වා නොතිබුණි. එසේම මෙම ඉලක්කගත යෝජනා ඉටුකළ බවට තහවුරු කරගත හැකි ක්‍රමවේදයක්ද නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙසට යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
---------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ගබඩා පරිපාලනය